(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

**අංක 85.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2025 සැප්තැම්බර් 25 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

204/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඊශ්‍රායලය සඳහා ගුවන් ගමන් ගාස්තු අඩු කරන ලද දිනය කවරේද;

(ii) අඩු කරන ලද ගාස්තු ප්‍රමාණය කොපමණද;

(iii) මේ වනවිට ඊශ්‍රායලයේ සේවය කරනු ලබන ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත සඳහන් ගුවන් ගමන් ගාස්තු අඩු කිරීමේදී විශාල වංචාවක් සිදුවී ඇති බව දන්නේද;

(v) ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

227/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් පිහිටුවීමට පොරොන්දුවූ 'රාජ්‍ය වත්කම් ප්‍රතිෂ්ඨාපන ආයතනය' මේ වනවිට පිහිටුවා තිබේද;

(ii) එම ආයතනය මඟින් මේ වනවිට රජයට අත්පත් කරගෙන ඇති සොරාගත් වත්කම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ආයතනයේ මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) 2025 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද විසර්ජන පනත් කෙටුම්පත මඟින් හෝ අතුරු සම්මත ගිණුම මඟින් එම ආයතනය සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

298/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පරිභෝජනය සඳහා වර්ෂයකට අවශ්‍ය ලුණු ප්‍රමාණය කොපමණද;

(ii) එම ලුණු ප්‍රමාණය සපයා ගන්නා ආකාරය කෙසේද;

(iii) ලුණු නිෂ්පාදනය කරනු ලබන රජයේ ආයතන සහ පෞද්ගලික ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) වැඩි වශයෙන් ලුණු නිෂ්පාදනය කරනු ලබන ප්‍රදේශ කවරේද;

(v) ලුණු අස්වැන්න ගබඩා කරනු ලබන ගබඩා පිහිටුවා ඇති ස්ථාන කවරේද;

(vi) එම ගබඩාවල ධාරිතාවය සහ එකී ධාරිතාවයන් කොපමණ කාලසීමාවක් සඳහා ප්‍රමාණවත් වන්නේද යන්න වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2024.01.01 දින සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ලුණු ආනයනය කර තිබේද;

(ii) එසේ නම්, ලුණු ආනයනය කරන ලද අවස්ථා සංඛ්‍යාව සහ එම එක් එක් අවස්ථාවේදී ආනයනය කරන ලද ලුණු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ලුණු ආනයනය කිරීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

314/2024

ගරු රවී කරුණානායක මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමෘද්ධි බැංකුව සතු වත්කම්වල වර්තමාන වටිනාකම කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ තිබෙන සමෘද්ධි බැංකු සංඛ්‍යාව සහ සමෘද්ධි මහා සංගම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සියලු සමෘද්ධි මහා සංගම් සතු වත්කම්වල වර්තමාන වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සමෘද්ධි බැංකු ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණයට යටත් වන්නේද;

(ii) නොඑසේ නම්, එය එකී අධීක්ෂණයෙන් බැහැර කිරීමට හේතු කවරේද;

(iii) සමෘද්ධි බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සභාපතිවරයා කවුරුන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පසුගිය වසර 10 තුළ සමෘද්ධි බැංකුව ලැබූ ලාභ/අලාභ වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පසුගිය වසර 10 තුළ සමෘද්ධි බැංකුවේ ශේෂ පත්‍ර අගය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සමෘද්ධි බැංකුවේ කොටස් හිමියන් කවුරුන්ද;

(iv) සමෘද්ධි බැංකුව විසින් ගලපන ලද පරිදි, තැන්පතුකරුවන්ට ගෙවන පොලී අනුපාතය සහ ණය ගැණුම්කරුවන්ට ණය දීමේ පොලී අනුපාතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

5\.

824/2025

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022 වර්ෂයේ සිට 2024 දක්වා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ආනයනය කරන ලද බොර තෙල් ප්‍රමාණය සහ පිරිපහදු කරන ලද තෙල් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම තෙල් ආනයනය කිරීමේදී ඊට අදාළ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කර තිබේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) එම කාලසීමාව තුළදී හදිසි මිලදී ගැනීම් ලෙස මිලදී ගෙන ඇති, බොර තෙල් ප්‍රමාණය සහ පිරිපහදු කරන ලද තෙල් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) හදිසි මිලදී ගැනීම් හා සාමාන්‍ය ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය හරහා කරනු ලබන මිලදී ගැනීම් අතර පවතින මූල්‍යමය වෙනස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

6\.

902/2025

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සත්ත්ව සංගණනය සිදු කරන ලද දිනය කවරේද;

(ii) එම සංගණනය සඳහා වියදම් කරන ලද මුදල කොපමණද;

(iii) එම සත්ත්ව සංගණනය කිරීමේ අරමුණු කවරේද;

(iv) එම අරමුණු ඉටු කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) මේ වනවිට එම සංගණනයට අදාළ ප්‍රගතිය කවරේද;

(vi) එම සංගණනය අනුව රිලවුන්, වඳුරන්, දඬුලේනුන් සහ මොනරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සත්ත්ව සංගණනය සිදු කරන ලද ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(ii) සත්ත්ව සංගණනය සිදු නොකරන ලද ග්‍රාම නිලධාරි වසම් කවරේද;

(iii) එම ග්‍රාම නිලධාරි වසම්වල සත්ත්ව සංගණනය සිදු නොකිරීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

983/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල ඇතුළු සියලුම කාර්යාලවල සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) මණ්ඩලයේ සේවය කරනු ලබන සේවකයන්ගේ වැටුප් සහ ඔවුන්ට අවශ්‍ය අනෙකුත් පහසුකම් නොපිරිහෙලා ලබා දිය යුතු බව පිළිගන්නේද;

(iii) වැටුප් කප්පාදු කිරීමක් සම්බන්ධයෙන් මණ්ඩලයේ සේවකයන් පසුගිය දිනවල උද්ඝෝෂණයක නිරතවූ බව දන්නේද;

(iv) එසේ නම්, එම වැටුප් කප්පාදු කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1123/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවය අතහැර ගොස් සිටින ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සෙබළුන්/නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් ශ්‍රී ලංකා පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇති සංඛ්‍යාව සහ භාරවී ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(iv) ඔවුන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් ඉවත් කිරීමට ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ගුවන් හමුදාවට C-130 ගුවන් යානයක් මිලදී ගැනීමට කටයුතු කරන බව දන්නේද;

(ii) මේ වනවිට ගුවන් හමුදාව සතු C-130 ගුවන් යානා සංඛ්‍යාව කොපමණද;

(iii) එම ගුවන් යානාවල නඩත්තු කටයුතු අවසන්වරට සිදු කරන ලද කාල වකවානු කවරේද;

(iv) නව C-130 ගුවන්යානයක් මිලදී ගැනීමේ අරමුණ කවරේද;

(v) එම නව C-130 යානය පරිත්‍යාගයක්ද; නොඑසේ නම්, මිලදී ගැනීමක්ද;

(vi) එමඟින් ඉටු කර ගැනීමට අපේක්ෂිත කාර්යයන් මේ දක්වා ඉටු කර ගත් ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1159/2025

ගරු අජිත් ගිහාන් මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ගොවිපළ ඉස්සන් වගාව සිදු කරන බවත්;

(ii) එහෙත් වෙනත් රටවලින් ශ්‍රී ලංකාවට ඉස්සන් ආනයනය කර ප්‍රතිඅපනයනය කරන බවත්;

(iii) ඒ හේතුවෙන් ශ්‍රී ලංකාවේ ඉස්සන් වගා කර්මාන්තයට සහ එම කර්මාන්තයේ නිරතවන පුද්ගලයන්ට අහිතකර බලපෑමක් සිදු වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ඉස්සන් ප්‍රතිඅපනයනය කිරීම වෙනුවට ශ්‍රී ලංකාවේ ඉස්සන් වගාව දිරිගැන්වීම සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1279/2025

ගරු නිශාන්ත පෙරේරා මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022 සහ 2023 වර්ෂවල ගාල්ල දිස්ත්‍රික්කය තුළ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් තේ තවාන් පවත්වාගෙන යාම සඳහා ආධාර ලබාදී තිබේද;

(ii) එසේ නම්, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් ආධාර ලබා දුන් තේ තවාන් සංඛ්‍යාව, ආධාරලාභියාගේ නම, ලබා දුන් ආධාර මුදල සහ තේ තවානේ ලියාපදිංචි අංකය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත ආධාරලාභීන් අතරින් මේ වනවිට තේ තවාන් පවත්වාගෙන යනු ලබන ආධාරලාභීන්ගේ සහ තේ තවාන් පවත්වාගෙන යනු නොලබන ආධාරලාභීන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 අගෝස්තු 15 දිනැති අංක 2449/60 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.09.12 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*4.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*5.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරික්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— "2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරික්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---